## 243 අපට ලොවක් ඇත

අපට ලොවක් ඇත කදිම රටක් ඇත
ගමක් බිමක් ඇත ගෙයක් දොරක් ඇත
ඒ හැම දේ ගැන ඔබට පුදමු තුති දෙව් සමිඳේ

කන්න දෙයක් නැති
බොන්න දෙයක් නැති
කුසගින්නේ ඇති පොඩි දරුවන්
සුරකිනු මැන සමිඳේ //

ඉගෙන ගන්න නැති
පාසැල් යනු නැති
අත මිට හිඟ ඇති පොඩි දරුවන්
සුරකිනු මැන සමිඳේ //

ඉන්න ගෙයක් නැති
මහ මඟ වැතිරෑ'ති
අනුන් පිහිට නැති පොඩි දරුවන්
සුරකිනු මැන සමිඳේ //